මිනිපේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මිනිපේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 නොසැසඳු පාලන ගිණුම්
---------------------------

ගිණුම් විෂයයන් 4 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වුන ශේෂයන්ගේ එකතුව රු.42,828,296 ක් වුවත්, උපලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.42,625,522ක් වූයෙන් රු.219,644 ක නොසැසඳීමක් විය.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතු වටිනාකම රු.15,683,659 ක් වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.5,930,209 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතු වටිනාකම රු.27,317,916 ක් වූ අතර, එයින් වසරක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.9,387,496 ක් විය.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

---

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.54,232,732ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සනාථ කිරීමට නොහැකි විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 18 වන වගන්තිය | ඉඩම් ගොඩනැගිලි ප්‍රජාශාලා, සුසාන භූමි, 54 ක අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2012 සැප්තැම්බර් මස අංක එන්පී/ආර්ටීසී/ටීආර්/එල්එම්/12/07 දරන ත්‍රීරෝද රථ සේවාව නියාමනය කිරීම සඳහා වැඩ පිළිවෙලක් හඳුන්වාදීම නැමැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් ප්‍රතිපත්ති රාමුව | ත්‍රීරෝද රථ නැවතුම්පල සකසා ලියාපදිංචිකර අවසර පත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වුවත්, එම උපදෙස් අනුගමනය කර නොතිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 චක්‍රලේඛයේ 12 ඡේදය | කඩ කාමර වර්ෂ 5 කට වරක් තක්සේරු කර ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,202,234 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,064,413 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,137,821 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,137,821 ක වර්ධනයට ව්‍යාපාර බදු රු.441,849 ක් වැඩිවීම, රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.2,553,154 ක්, කුලී ආදායම් රු.494,998 ක් වැඩිවීම හා සේවා සඳහා ගාස්තු රු.845,059 ක් වැඩිවීම මූලික වශයෙන් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේ මුළු ජංගම වත්කම් හා මුළු ජංගම වගකීම් අතර, අනුපාතය 1.5:1 සහ 1.2:1 ක් විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 වරිපනම්

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.461,669 ක් වූ අතර, ඉන් වර්ෂය තුළදී අය කර තිබුණේ රු.205,788 ක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 44 ක් විය.

2.4.2 බදුකුලී

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ ශේෂය රු.2,356,014 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.1,088,558 ක් විය. ඉන් වර්ෂය තුළදී අයකර තිබුණේ හිඟයෙන් රු.222,136 ක් හා බිල් කිරීම් වලින් රු.401,840 ක් පමණි.

(ආ) හසලක නගරයේ අධිකරණ කාර්යාලයක් පවත්වාගෙන යාමට බදුදී තිබුණු ගොඩනැගිල්ල සඳහා ලැබිය යුතු රු.103,503 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4.3 වෙනත් ආදායම්

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.2,193,884 ක හිඟ ජල ගාස්තු ශේෂයෙන් වර්ෂය තුළ අයකරගෙන තිබුණේ රු.1,223,605 ක මුදලක් පමණි. එය මුළු හිඟයෙන් සියයට 55 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.1,792,587 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂයක කාලයක් ඉක්මවූ රු.970,279 ක ශේෂ ඇතුළත් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 31 දිනට පැවති රු.99,529 ක් වූ විනෝද බදු ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

උසාවි දඩ හා මුද්දර ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,287,200 ක් අයවිය යුතුව තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හසලක සතිපොළේ ප්‍රයෝජනයට නොගන්නා ගොඩනැගිලි තිබියදී සමාලෝචිත වර්ෂයේදී රු.600,000 ක් වැය කර වර්ග අඩි 300 ක පමණ ගොඩනැගිල්ලක් ඉදිකර

තිබුණි. එළවළු වෙළඳුන් තොග පොළ තුළ තාවකාලික හට් වල හා පාර දෙපස වෙළඳාම් කටයුතු සිදුකර තිබුණු අතර, එළවළු වෙළඳුන් සඳහා ගොඩනැගිලි ඉදිකර දීමට සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් ඉහළ නැංවීම ප්‍රාදේශීය සභාවකින් ඉටු විය යුතු ප්‍රධාන කාර්යයක් වුවද, කාණු පද්ධති පිරිසිදු කිරීම, නගරය පිරිසිදුව තබා ගැනීම කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) පුනරාවර්තන ආදායමෙන් අවම වශයෙන් සියයට 30 ක් සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රු.12,101,605 ක පුනරාවර්තන ආදායමෙන් සියයට 15 ක් පමණක් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යොදවා තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තනතුරු 4 ක පුරප්පාඩු 14 ක් පැවති අතර, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හසලක නගරයේ පිහිටි කඩ කාමර 20 ක බදුකරුවන් විසින් දිගින් දිගටම ගෙවා නොතිබුණු කඩකාමර කුලී රු.2,810,646 ක් සම්බන්ධයෙන් නඩු පැවරීමට සිදුවී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහනට ලැබී තිබුණු රු.160,682 ක මුදල සමාලෝචිත වර්ෂයේ අවසාන දිනය වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඈ) 2013 වර්ෂයේ පළාත් පාලන සතිය ජයග්‍රහණය හා 2014 මැදරට පළාත් අභිනව සම්මාන උළෙල වෙනුවෙන් ලැබී තිබුණු රු.115,000 ක මුදල ප්‍රයෝජනයට නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වසරේ මිලදී ගෙන තිබූ රු.75,900 ක් වටිනා ජල මීටර් 33 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ දමා තිබුණි.

(ආ) ව්‍යාපාරික හා ගෘහස්ථ ජල පාරිභෝගිකයින්ගෙන් පිළිවෙලින් 86 කට හා 1213 කට ජලය සපයා තිබුණද, ඉන් ජලමනු සවිකර තිබුණේ ව්‍යාපාරික 36 ක් හා ගෘහස්ථ 891 දෙනෙකු සඳහා පමණි.

3.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

---

වර්ෂ 3 ක සිට අංක CP 270-0270 දරන ටැෆේ ට්‍රැක්ටරය හා අංක LE-7543 දරන මහේන්ද්‍ර ලොරිය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

3.5 හඳුනාගත් අලාභ

---

සභාව සතු ඉඩමක දමා තිබුණු පෞද්ගලික අයකුගේ අත්තිවාරමක් ඉවත් කිරීම සඳහා රු.24,709 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් ලබාදී තිබුණද, එම මුදල ගෙවා නොතිබුණි. ඉන් අගතියට පත් පාර්ශවය විසින් හිටපු සභාපතිවරයා හා ප්‍රාදේශීය සභාව විත්තිකරුවන් කරමින් මහනුවර දිසා අධිකරණයේ පවරු නඩුවෙන් පැමිණිලිකරුට රු.500,000 ක මුදලක් හා ඊට අදාළ නෛතික පොළියක් ගෙවිය යුතු බවට 2005 වර්ෂයේ තීන්දුවක් ලබා දී තිබූ අතර, ප්‍රාදේශීය සභාව මුදල් නොගෙවීම හේතුවෙන්, ප්‍රාදේශීය සභාව සතු අංක 252 - 6504 දරන මිට්සුබිෂි කැබ් රථය හා හසලක නගරයේ අංක 14 දරන කඩ කාමරය අධිකරණයේ භාරයට ගෙන තිබුණි. 2016 දෙසැම්බර් 31 වන විටත් කැබ් රථය අධිකරණයේ තහනමට පවරා ස්වාභාවික ආපදාවලට ලක්වෙමින් සහා භූමියේ දිරාපත් වෙමින් පැවතුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

---

(අ) පළුගොල්ල ජල යෝජනා ක්‍රමය ගබඩා ටැංකිය වටා වැට ඉදිකිරීම

---

2016 වර්ෂයේ මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය ආධාර ප්‍රජා ජල - වැඩසටහන යටතේ පළුගොල්ල ජල ටැංකිය වටා වැට ඉදිකිරීම කර්මාන්තය සඳහා රු.211,748 ක් ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) වැඩ විෂයය අංක 1 අනුව 1:2:4 (19)සිමෙන්ති කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් අඩි 6 ක් උස කම්බි කණු අඩි 8 න් 8 ට සිටුවා කටු කම්බි පොටවල් හයක් සිටින සේ වැට සැකසීමට දිග මීටර් 76.50 කට රු.104,499 ක් ගෙවා තිබුණද, දුර්වල කම්බි කණු භාවිතා කර වැට සකසා තිබුණු අතර, කණුවේ පතුලේ ඝනකම 6" 6" ක් හා මුදුනේ ඝනකම 4" 4" ක් විය යුතු වුවද, මෙහි පතුල අඟල් 5:4" ක් හා මුදුන අඟල් 4" ක් ආදී වශයෙන් පැවතීමෙන් ඇස්තමේන්තු ප්‍රමිතියට අනුව වැට සකසා නොතිබුණි.

(ii) වැඩ විෂයය අංක 10 අනුව වැට කණු හා ගේට්ටු කුළුණු සිටුවීම සඳහා මි.මී. 225 ගැඹුරට ගල විද මි.මී. 12 ප්‍රමාණයේ හා මි.මී. 525 ක් දිග කම්බි යොදා කම්බි කණු සවි කිරීම සඳහා රු.17,800 ක් ගෙවා තිබුණද, උපදෙස් වලට අනුව කම්බි කණු සවි නොකිරීම හේතුවෙන් සියළුම කම්බි කණු පහසුවෙන් ඉවත් කිරීමට හැකියාව පැවතුණි.

(ආ) පුස්තකාලය ඉදිරිපිට ළමා උද්‍යානය ඉදිකිරීම

2016 පෙබරවාරි 29 දිනැති හා අංක 1/2016 දරන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාත්මක කළ නොහැකි ව්‍යාපෘතියක් වන හසලක පුස්තකාලයේ මිදුලට කුට්ටිගල් ඇල්ලීම, කොන්ක්‍රීට් වැට ගැසීම සඳහා රු.499,745 ක මුදලක් වැයකර තිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයයන් 11 ක් සඳහා වෙන්කල රු.3,555,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 7 ක් සඳහා ඇස්තමේන්තුගත රු.395,000 ක ආදායමෙන් කිසිදු මුදලක් උපයාගෙන නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේ දී සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

05. පද්ධති හා පාලනය
----------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගිණුම්කරණය
(ඇ) වාහන පාලනය
(ඈ) ආදායම් පාලනය
(ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ
(ඊ) කොන්ත්‍රාත් පාලනය